(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(3).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2012 නොවැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා

## 2012 නොවැම්බර් මස 19 වැනි සඳුදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2247/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2011 අප්‍රේල් 01 වැනි දින ස්ථාපිත කරනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාවේ නිල කාල සීමාව;

(ii) එම කොමිෂන් සභාව සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් නිලධාරියාගේ සම්පූර්ණ නම හා අදාළ සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බදු අභියාචනා කොමිෂන් සභාව සඳහා කුලියට ගත් පස්මහල් ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ස්ථානය සහ ඒ සඳහා මාසිකව ගෙවන ලද කුලිය කවරේද;

(ii) එම කොමිෂන් සභාවේ සේවක වැටුප්, ජල සහ විදුලි බිල්පත් ඇතුළු පුනරාවර්තන වියදම් වෙනුවෙන් එහි පළමු මාස හය තුළ වැයවී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ පැවති බදු අභියාචනා ගොනු 120ක් අභිනව බදු අභියාචනා කොමිෂන් සභාව වෙත පැවරූ බවත්;

(ii) එම ගොනු සම්බන්ධ විභාග කිසිවක් අදාළ කාලසීමාව තුළ අවසන් කර නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් රජයට රුපියල් කෝටි 800ක පමණ මුදලක් අහිමිව ගිය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2491/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බහරේන්හි සේවය කළ, අක්මීමන, හියාරේ, නුගේකන්ද ප්‍රදේශයේ පදිංචි මාදුගැට ගමගේ ධර්මවතී නැමැති තිදරු මවට ඇය සේවය කළ අදාළ නිවසේ හිමිකාර කාන්තාව විසින් බලෙන් කම්බි කොකු ගිල්වීම හේතුවෙන් අසාධ්‍යව මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්;

(ii) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 'සහන් පියස' රක්ෂණ ක්‍රමය යටතේ ඇය හිමිකම් මුදලක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහන් පියස රක්ෂණ ක්‍රමය යටතේ ධර්මවතී මහත්මියට හිමිකම් මුදලක් ලබාදීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2612/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඌව අධ්‍යාපන විද්‍යාපීඨයේ ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා පසුගිය කාලයේදී වාර්ෂිකව සිසුන් 120 දෙනෙකු බඳවාගෙන ඇති බවත්;

(ii) ප්‍රතිපාදන කප්පාදුව හේතුවෙන් 2012 වර්ෂයේදී එම විද්‍යාපීඨයට බඳවාගෙන ඇත්තේ සිසුන් 60ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයිනේ සමස්ත පාසල් පද්ධතිය තුළ ශාරීරික අධ්‍යාපන ගුරුවරු සඳහා පුරප්පාඩු පවතින බවත්;

(ii) 2012 වර්ෂයේදී ඌව අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවාගත් ශාරීරික අධ්‍යාපන සිසුන්ගේ සංඛ්‍යාව අඩකින් අඩුකිරීම හේතුවෙන් ඉහත සඳහන් පුරප්පාඩු සපුරාලීමේ ඉලක්කය සපුරාගත නොහැකි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ඇති, ඌව පළාත ඇතුළුව දිවයින පුරා සිටින සිසුන්ට ඉහත තත්ත්වය නිසා මෙම වර්ෂයේදී සිදුවූ අසාධාරණය මඟහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2996/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රාජ්‍ය සේවය තුළ සිටින කළමනාකරණ සහකාරවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් 2011 සහ 2012 වර්ෂයන්හිදී බඳවාගත් කළමනාකරණ සහකාරවරුන් සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විවිධ රාජ්‍ය ආයතනවල රාජකාරී සඳහා නිසි වැඩපිළිවෙළකින් තොරව උපාධිධාරීන් අනුයුක්ත කිරීම නිසා කළමනාකරණ සහකාර තනතුරුවලට ගැටලුවක් මතුව තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එම ගැටලුව විසඳීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1647/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කොට්ටන්තිවු ග්‍රාමීය රෝහල විවෘත කර වර්ෂ හයක් ගතවී ඇතත් මෙතෙක් කිසිම රෝගියකු රෝහලට ඇතුළත් කරගෙන නොමැති බවත්;

(ii) රෝහල විවෘත කළ ද භෞතික සම්පත් සහ මානව සම්පත් නිසි ලෙස ලබා නොදීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා රෝහලේ පවතින අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2300/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශය සමග විවිධ කටයුතුවල නිරත වී සිටින රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) පසුගිය වර්ෂ දහයක කාලය තුළ වතුකරයේ සහ උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් ප්‍රදේශවල විවිධ රාජ්‍ය නොවන ආයතන අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව විවිධ ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් යටතේ ඉටු කරන ලද කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) උක්ත වැඩසටහන් යටතේ පසුගිය වර්ෂ දහය තුළ ඒ ඒ ආයතනය වෙතින් අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණු මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2525/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දෙසැම්බර් 31 වනවිට,

(i) පළාත් සභාවන්හි පාලනය යටතේ පැවති පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එක් එක් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් එම පළාත් සභා යටතේ පාලනය වන පාසල් සඳහා 2012 වර්ෂයට අදාළව වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2851/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2000 අංක 9 දරන වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ, "වැඩිහිටි හැඳුනුම්පත්" නිකුත් කරනු ලබන්නේද;

(ii) එම හැඳුනුම්පත පිටුපස සෞඛ්‍ය සේවා, බැංකු සේවා, පොලිස් සහ නීති උපදෙස්, තැපැල් හා විශ්‍රාම වැටුප් සහ කාර්යාල කටයුතු යන සේවාවන්වලදී හැඳුනුම්පත්ලාභියාට ප්‍රමුඛතාවයක් ලැබිය යුතු බව සඳහන් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී ප්‍රමුඛතාවය ලබා දීම සඳහා,

(i) රජය විසින් සකස් කොට ඇති නීති හා පනවා ඇති රෙගුලාසි කවරේද;

(ii) එම නීති සහ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අවම වශයෙන් රජයේ රෝහලක වෛද්‍යවරුන් මුණ ගැසීම, සායනයන්ට සහභාගී වීම සහ බෙහෙත් ලබාගැනීම යන කටයුතුවලදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා නීතිමය බලය ලැබෙන චක්‍රලේඛයක් සහ / හෝ රෙගුලාසියක් හැකි ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 21 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2110/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරීත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකුණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරීත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2346/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය කළ යුතු ආයතනය කවරේද;

(ii) 2000, 2005 සහ 2010 වර්ෂවලදී එම ආයතනය යටතේ ලියාපදිංචි වී ඇති ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවාට අදාළ ළමුන් සංඛ්‍යාව, පාලිකාවන් සංඛ්‍යාව සහ සහායිකාවන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2548/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

3004/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් කාර්යයන් සඳහා වඩාත් ජනප්‍රිය කුමන වටිනාකමක මුද්දරද යන්න එම ජනප්‍රියත්වයේ අනුපිළිවෙළින් කවරේද;

(ii) රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 2 x සෙ.මී. 2.5ක් වේද;

(iii) නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (Institute of Ship Brokers) 25 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් මුද්‍රිත රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයේ දිග සහ පළල කොපමණද;

(iv) පේරාදෙණිය සංගිලි පාලම සහ මහකන්දරාවේ ඉපැරණි ගල් පාලම මුද්‍රිත රු. 10/=ක වටිනාකමින් යුත් මුද්දර දෙකේ දිග සහ පළල කොපමණද;

(v) ඉහත (iii) සහ (iv) හි සඳහන් කළ එක් එක් මුද්දරයේ සහ මුද්දරවල, කඩදාසි, මුද්‍රණ, ප්‍රවාහන, ගබඩාකරණ සහ බෙදාහැරීම් යනාදී වියදම් ද ඇතුළත් සමස්ත පිරිවැය කොපමණද;

(vi) සෙ.මී. 2 x සෙ.මී. 2.5ක සාමාන්‍ය ප්‍රමාණයේ රු. 5 මුද්දරයක වියදම සමඟ ඉහත (iii) සහ (iv) හි සඳහන් එකිනෙක මුද්දරයක වියදම සන්සන්දනාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2291/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පළාත් පාලන ආයතන මගින් පාලනය වන පෙරපාසල්වල පාලිකා තනතුරු වෙනස් කිරීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතන යටතේ ඇති පෙරපාසල්වල පාලනය වෙනත් ආයතනයන්ට මාරුකර තිබේද;

(ii) එසේ පාලනය මාරු කර ඇති පෙරපාසල් කවරේද;

(iii) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක ඩීඑම්එස්/ඩී3/97/27/02 දරන ලිපිය මගින් අලුතින් පෙරපාසල් පාලිකා තනතුරු අනුමත නොකිරීමට ගෙන ඇති තීරණය පළාත් පාලන ආයතනවලින් පාලනය වන පෙරපාසල් වැසීයාමට හේතුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2884/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර සමිතිවල මූල්‍ය හා පරිපාලන බලතල නිලවරණයෙන් පත්වන සභාපති සහ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත හිමිවීමෙන් එම සමිතිවල පරිපාලන හා මූල්‍ය කටයුතුවලදී දූෂණ හා අක්‍රමිකතා සිදුවන බවත්;

(ii) එම තත්ත්වය යටතේ මාතලේ, රත්තොට සමූපකාර සමිතියේ මූල්‍ය පරිපාලනයේදී සිදුව ඇති තදබල වංචා හා දූෂණ හේතුවෙන් එම සමිතිය දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව ඇති බවත්;

(iii) මූල්‍ය අර්බුදය හේතුවෙන්, ඒ සමූපකාර සමිතියට තම ප්‍රදේශික සහ ''කෝප්සිටි'' පවත්වාගෙන යෑමට නොහැකිවීමෙන් එම සමිතියේ පාරිභෝගිකයින් දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රත්තොට විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) ප්‍රාදේශික, ''කෝප්සිටි'', සංඛ්‍යාව දැනට ක්‍රියාකාරී තත්ත්වයේ ඇති ප්‍රාදේශික සහ ''කෝප්සිටි'' සංඛ්‍යාව සහ සේවක සංඛ්‍යාව;

(ii) නිලවරණයට ප්‍රාදේශිකවලින් සහභාගි විය යුතු මහා සභා නියෝජිතයන්

සංඛ්‍යාව සහ 2010.03.20 දින පැවැත්වූ නිලවරණයට සහභාගී වූ එකී නියෝජිතයන් සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සමුපකාර සමිතිවල සිදුවන පරිපාලන දුර්වලතා, දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීමට ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(ii) රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ සිදු වී ඇති දූෂිත ගනුදෙනු සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2916/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ විශ්‍රාම වැටුප් ලබාගැනීමේ ක්‍රියාවලියේදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මුහුණපාන දුෂ්කරතා වළක්වා ගැනීම සඳහා විශ්‍රාම වැටුප නිවසටම ලැබෙන නව ක්‍රමයක් ක්‍රියාත්මක කරන බවට පොරොන්දුවක් 2010 වර්ෂයේ ඉදිරිපත්කළ "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පොරොන්දුව පරිදි ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප නිවසටම ලැබෙන නව ක්‍රමය කවරේද;

(iii) ඉහත කී පොරොන්දුව මෙතෙක් ඉටු කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2954/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක්සත් හෙද සංගමය තම ඉල්ලීම් 15ක් පිළිබඳව සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇතත් මෙතෙක් එම ඉල්ලීම් ඉටු වී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සාකච්ඡාවලදී එක්සත් හෙද සංගමය විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් කවරේද;

(ii) ඒවායින් මේ වන විට ඉටුකර දී ඇති ඉල්ලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) සෞඛ්‍ය ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඉවහල් වන ඉහත හෙද සංගමය ඉදිරිපත් කළ සියලු ඉල්ලීම් ඉටු කර දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2830/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා යොදාගන්නා ක්‍රියාවලිය කවරේද;

(ii) ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) සැපයුම් දිනය, සැපයුම් කාල සීමාව සහ එකඟ වී ඇති කාල පරිච්ඡේදය තුළ සැපයුම් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සැපයුම් කොන්ත්‍රාත්තුවෙහි දක්වා ඇති සම්මත වගන්ති කවරේද;

(iv) 2008, 2009, 2010 හා 2011 යන වර්ෂවලදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ මුදල සහ වියදම්කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූලික පරීක්ෂණයකදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ වංචාවක් හෙළිදරව් වී ඇති බවත්;

(ii) වැඩිදුර පරීක්ෂණ සඳහා මෙම වංචාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එකී වංචාවේ ස්වභාවය කවරේද;

(ii) එකී වංචාව හේතුවෙන් සිදුව ඇති මූල්‍යමය පාඩුව කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් පරිදි එය සිදු කළේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2917/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන කාර්ය පටිපාටික නීතියක් නොපවතින බවත්;

(ii) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීතියක් පැනවීම සිදුකළයුතු බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් "ටොනි ෆනැන්ඩු" නඩුවේදී නිර්දේශකර ඇති බවත්;

(iii) අධිකරණයට අපහාසකිරීම පිළිබඳ කාර්ය පටිපාටික නීති කෙටුම්පතක් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් අනුමතකොට, අධිකරණ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ අධිකරණයට අපහාස කිරීමට අදාළව කාර්ය පටිපාටික නීතියක් ඉක්මනින් පැනවිය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2955/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2012 අගෝස්තු 06 වැනි දින පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍රයේ තිබූ වැරදි හේතුවෙන් එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී සිසුන් මහත් අපහසුතාවයන්ට පත්වූ බවත්;

(ii) ප්‍රශ්න පත්‍රයේ තිබූ දෝෂ සහිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උත්සාහ ගැනීම නිසා නිසි පරිදි කාලය කළමනාකරණය කරගැනීමට නොහැකිවූ බැවින් එම සමස්ත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සිසුන් දැඩි පීඩනයක් යටතේ සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උසස්පෙළ විභාග ප්‍රශ්න පත්‍ර සිසුන්ට ලබා දීමට පෙර නැවත පරීක්ෂාවකට ලක් නොකරන්නේද;

(ii) 2012 අ.පොස. උසස් පෙළ විභාගයේදී සංයුක්ත ගණිතය විෂයය සඳහා ඉදිරිපත්වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ බලධාරීන්ගේ වගකීමෙන් තොර ක්‍රියාවලිය හේතුවෙන් අපහසුතාවයන්ට පත්වූ ගණිත අංශයෙන් ඉහත විභාගට ඉදිරිපත්වූ සිසුන්ට සාධාරණයක් ඉටු කර දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3000/’12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 ජූනි 23 වැනි දින සිදුවී ඇති ප්‍රමිතියෙන් තොර ඩීසල් ආනයනය කිරීමේ සිද්ධිය සම්බන්ධව සොයා බැලීමට කමිටුවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) ප්‍රමිතියෙන් තොර ඩීසල් ආනයනය කොට බෙදා හැරීම හේතුවෙන් සිදුවී ඇති හානිය තක්සේරු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි ආනයනය කළ ප්‍රමිතියෙන් තොර ඩීසල් භාවිතය නිසා හානියට පත්වූ වාහන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි අනුව හානියට පත්වී ඇති රාජ්‍ය ආයතනවල වාහන සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වාහනවලට සිදුවූ හානි හේතුවෙන් එක් එක් ආයතනයට සිදුවී ඇති මූල්‍යමය අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ප්‍රමිතියෙන් තොර ඩීසල් භාවිතය නිසා හානියට පත් පෞද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(v) එම බස්රථවලට සිදුවී ඇති හානිවල මූල්‍යමය වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 නොවැම්බර් මස 24 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2832/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතය කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන් තබා තිබේද;

(ii) ශ්‍රී ලංකා රජය විසින් එම සම්මුතිය ශ්‍රී ලංකාව තුළ නිල වශයෙන් වලංගු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම සම්මුතිය ශ්‍රී ලංකාව තුළ නිල වශයෙන් වලංගු නොකිරීමට හේතු කවරේද;

(iv) 2006 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(v) එම සම්මුතිය බලාත්මක කිරීම සඳහා දේශීය වශයෙන් ක්‍රියාත්මක කර ඇති නීතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2919/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1977.02.14 දින සිට 2009.05.19 දින දක්වා ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති කාලසීමාව තුළ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන්ගේ මව සහ පියා වෙනුවෙන් රුපියල් 750/-ක මාසික දීමනාවක් ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ යටතේ මාසික දීමනා ලබාදෙන මව්වරුන්ගේ සහ පියවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දීමනාව සඳහා අවශ්‍ය මුදල් රජය විසින් සපයන්නේද;

(ii) නොඑසේ නම්, එම මුදල සපයාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොලිස් නිලධාරීන්ගේ දෙමාපියන් වෙනුවෙන් රුපියල් 750/-ක මාසික

දීමනාවක් ගෙවීම ප්‍රමාණවත්ද;

(ii) එසේ නම්, එම ප්‍රමාණවත් බව සනාථ කිරීමට පදනම්කරගත් තර්කය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2956/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයට ගැලපෙන අයුරින් වෛද්‍ය විද්‍යාව සඳහා නව විෂය ක්ෂේත්‍ර එකතු කරනු වෙනුවට පවතින වෛද්‍ය විද්‍යා විෂය නිර්දේශයෙන් කොටස් ඉවත් කරමින් සහ ඒ සඳහා වන ප්‍රතිපාදන අඩු කරමින් සිටින බවත්;

(ii) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සඳහන් කර ඇති පරිදි ඉහත තත්ත්වය යටතේ අදාළ විෂයය නිර්දේශයෙන් ශල්‍ය වෛද්‍ය විද්‍යා කොටස ඉවත් කරමින් සිටින බවත්;

(iii) එමගින් ගුණාත්මක වෛද්‍ය ක්ෂේත්‍රයක් ඇති කිරීමට ගත් උත්සාහයන් ගැටලුකාරී තත්වයකට ඇද දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට වෛද්‍ය උපාධිය සඳහා නිර්දේශිත විෂයන් කවරේද;

(ii) වෛද්‍ය උපාධියට අදාළ විෂය නිර්දේශයෙන් ශල්‍ය වෛද්‍ය ක්ෂේත්‍රය ඉවත් කිරීමට හේතුව කවරේද;

(iii) ගුණාත්මක වෛද්‍යවරයෙකු බිහි කිරීම සඳහා ශල්‍ය වෛද්‍ය අංශයේ දැනුමද මහෝපකාරී නොවන්නේද;

(iv) ශල්‍ය වෛද්‍ය විෂයය ක්ෂේත්‍රය වෛද්‍ය උපාධියෙන් ඉවත් නොකොට පූර්ණකාලීනව එම උපාධියේ විෂය පථය තුළ තබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3006/’12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණු වනුයේ රජයේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය කාර්ය සාධනය ඇගයීමට මහජනතාවට අවස්ථාව ලබාදීම බවත්;

(ii) වියදම, ආදායම, මුදල් ප්‍රවාහ සහ ණය ගැනීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබඳ ප්‍රකාශනයක් එකී වාර්තාවේ අන්තර්ගත විය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2012 ජුනි 29 දිනැති 2012 සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි,

2012 පළමු මාස හතර සඳහා,

(i) ඇස්තමේන්තුගත සහ තථ්‍ය වියදම;

(ii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම;

(iii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රවාහය;

(iv) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ණය ගැනීම්;

ඇතුළත්ව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 26 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2833/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ අඩංගු මුදල් මණ්ඩල උපදේශක විගණන කමිටු වාර්තාවෙහි සඳහන් කර ඇති, නිව්යෝර්ක් නගරයේ පිහිටි ගොඩනැගිල්ල මිල දී ගත් දිනය කවරේද?

(ii) ඉහත සඳහන් මිලදී ගැනීම සිදු කිරීම සඳහා අනුමතිය ලබාදුන් නිලධාරියා සහ එම මිලදී ගැනීම සිදු කිරීමෙහි අරමුණ කවරේද;

(iii) එම ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ලිපිනය, ගොඩනැගිල්ලේ මහල් ගණන, එහි බිම් වර්ගඵලය සහ එය මිලදී ගැනීම සඳහා දරන ලද පිරිවැය කවරේද;

(iv) එය හවුල් ආයෝජනයක්ද; නැතහොත් ඒකල ආයෝජනයක්ද;

(v) එය හවුල් ආයෝජනයක් නම්, එයට සම්බන්ධ වී ඇති පාර්ශ්වයන්ගේ නම් සහ එක් එක් පාර්ශ්වය විසින් දරනු ලබන අයිතියේ ප්‍රතිශතය වෙන් වෙන්ව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කවර පුද්ගලයෙකුගේ නමින් එම ගොඩනැගිල්ල ලියා පදිංචිකර තිබේද;

(ii) මේ වනවිට එම ගොඩනැගිල්ල විකුණා හෝ කුලියට දී තිබේද;

(iii) එය විකුණා ඇත්නම්, මිල දී ගත් පුද්ගලයාගේ නම, ගත් මිල සහ විකිණීම සිදුකළ දිනය කවරේද;

(iv) එය කුළියට දී ඇත්නම්, කුළියට ලබාගත් පුද්ගලයින්ගේ නම්, අය කරනු ලබන කුළිය සහ බදු කාලසීමාව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2383/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ඇණවුම් කරන ලද ඖෂධ ලැබෙනතෙක් ඖෂධ සැපයීම් ඌනතාවන් නැති කිරීම සඳහා දේශීය වෙළඳපළෙන් මිලදී ගත් ඖෂධ සඳහා ගෙවීමට රුපියල් මිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් 2011 වර්ෂය තුළ අනුමතියට ඉදිරිපත් වී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව 2011 වර්ෂයේ ඖෂධ අවශ්‍යතාවයන් පිළිබඳව

ඇස්තමේන්තුවක් නොතිබුණේද;

(ii) ඇණවුම් ප්‍රමාද වූ නිසා ඉහත වර්ෂය තුළදී දේශීය වෙළඳපළෙන් මිලදී ගැනීමට සිදු වූ ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ඇණවුම් කිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) දේශීය වෙළඳපළෙන් එම ඖෂධ මිලදී ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාමාර්ගය කුමක්ද;

(v) දේශීය වෙළඳපළෙන් මිලදී ගත් ඖෂධ වර්ග, ප්‍රමාණය හා මිලදී ගත් ආයතනය වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2957/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1982 වර්ෂයේදී පවා විදේශයන් සමග සන්නිවේදනය කළ හැකි තරම් දියුණු සන්නිවේදන පද්ධතියක් හිමිව තිබූ බුලත්සිංහල ප්‍රධාන තැපැල් කාර්යාලය මේ වන විට දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) ආරම්භ කළ වර්ෂයේ සිට මේ වන තෙක් එම කාර්යාලයේ කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදුකර නොමැති බවත්;

(iii) මේ වන විට එහි නිලධාරීන් 11 දෙනෙකු සඳහා පුරප්පාඩු පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රධාන තැපැල් කාර්යාලය යටතේ පාලනය වන උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රධාන තැපැල් කාර්යාලයේ සහ ඉහත සඳහන් උප තැපැල් කාර්යාලවල සේවය කරනු ලබන මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රධාන තැපැල් කාර්යාලය වෙතින් පමණක් සේවය ලබන සේවාලාභීහු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බුලත්සිංහල ප්‍රධාන තැපැල් කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමටත්;

(ii) එහි පවතින අඩුපාඩු සොයා බලා ඒවා සම්පූර්ණ කර දීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3007/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිසියම් වර්ෂයක් සඳහා වන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ඇස්තමේන්තුගත ආදායම් හෝ මුදල් ප්‍රවාහයේ හිඟයක්, හෝ ඇස්තමේන්තුගත වියදම් සහ ණයගැනීම්වල අතිරික්තයක් සඳහා හේතු දැක්විය යුතු බව එතුමා දන්නෙහිද?

(ආ) 2012 වර්ෂය සඳහා වන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාරව;

(i) ඇස්තමේන්තුගත ආදායමේ හෝ මුදල් ප්‍රවාහයේ හිඟ තිබේද;

(ii) එසේ නම්, එබඳු වෙනස්වීම් සඳහා හේතු දක්වා තිබේද;

(iii) ඇස්තමේන්තුගත වියදමේ හෝ ණය ගැනීම්වල අතිරික්තයක් තිබේද;

(iv) එසේ නම්, එබඳු වෙනස්වීම් සඳහා හේතු දක්වා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 28 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2870/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෘෂ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය මගින් ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස ක්‍රියාත්මක කරන ලද අභියෝගතා පරීක්‍ෂණය නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත කී අභියෝගතා පරීක්‍ෂණය නතර කිරීම සඳහා වූ තීරණය ගැනීමට පෙර විශ්වවිද්‍යාල නිලධාරීන් සමග සාකච්ඡා කිසිවක් පවත්වන ලද්දේද;

(iii) නොඑසේ නම්, එවැනි සාකච්ඡාවක් නොපැවැත්වීමට හේතු කවරේද;

(iv) එසේ නම්, ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස අභියෝගතා පරීක්‍ෂණය පැවැත්වීම නතර කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල නිලධාරීන් දරන ලද ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තම හිතවත් අයදුම්කරුවන්ට කථිකාචාර්යවරුන් පක්ෂපාතී වන්නේය යන පදනම මත අභියෝගතා පරීක්ෂණය දූෂිත බවට අයදුම්කරුවන්ගෙන් අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පෙත්සම් ලැබී තිබේද;

(ii) එසේ නම්. මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් හෝ පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතුව කවරේද;

(iii) ඉහත කී අභියෝගතා පරීක්ෂණයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය උත්සාහ දරනු ලැබ තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2958/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේදී කුරුණෑගල ශික්ෂණ රෝහල තුළ හෘද ශල්‍ය ඒකකයක් සඳහා මහල් 6කින් යුක්ත වූ ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බවත්;

(ii) මෙතෙක් එම ගොඩනැගිල්ල තුළ ශල්‍යාගාරයක් පිහිටුවා ශල්‍යකර්ම සිදුකිරීම සඳහා අවස්ථාවක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හෘද සැත්කම් සිදුකරනු ලබන රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල්වල වාර්ෂිකව සිදුකරනු ලබන හෘද සැත්කම් සංඛ්‍යාව කොපමණද;

(iii) හෘද සැත්කම් සිදුකර ගැනීමේ අපේක්ෂාවෙන් මේ වන විට රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයන්හි ලියාපදිංචි වී සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඉදිකළ ඉහත ගොඩනැගිල්ලේ ශල්‍යාගාරයක් පිහිටුවීම සඳහා අනුමතිය ලබාදීමටත්;

(ii) ඒ සඳහා අවශ්‍ය ශල්‍ය උපකරණ හා ඖෂධ ලබාදීමටත්;

කඩිනමින් කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3031/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ මොරටුව - මෝදර ධීවර වරායේ නැවත ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍යමය ආධාර ලබා දුන් රට කවරේද;

(ii) ආධාර ලෙස ලැබුණු මුදල කොපමණද;

(iii) ඉහත සඳහන් ධීවර වරායේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මොරටුව - මෝදර දියකඩනයේ දිග සහ පළල මීටර්වලින් කොපමණද;

(ii) දියකඩනයේ නැම්ම මීටර් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3076/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පුල්මුඩේ ප්‍රදේශයෙහි ක්‍රීඩා පිටියක් නොමැතිකමින් සිය ගනණක් තරුණ තරුණියන් සහ පාසැල් දරුවන් අපහසුතාවයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රදේශයේ තරුණ තරුණියන්ට ඔවුන්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කර ගැනීමට හැකි වනු පිනිස සියලු පහසුකම් සහිත ක්‍රීඩා පිටියක් ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2959/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර අධ්‍යාපන කලාපය තුළ, 2012 පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් වෙනුවෙන් ලබාදුන් පෙරහුරු ප්‍රශ්න පත්‍රවල විශාල වැරදි සංඛ්‍යාවක් තිබී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ ප්‍රශ්න පත්‍ර සිසුන් හට ලබාදීමට පෙර ඒවායේ පවතින දෝෂ නිවැරදි කිරීමට බලධාරීන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමේ ආසන්න අවස්ථාවේ වැරදි සහිත පෙරහුරු ප්‍රශ්න පත්‍ර ලබා දී සිසුන්ට සිදුකර ඇති හානිය වෙනුවෙන් වගකිව යුතු

පාර්ශ්වයන් කවරේද;

(iii) ඉහත පරිදි ගැටලුකාරී තත්වයන් නැවත ඇති නොවන පරිදි වගකීමකින් යුතුව ක්‍රියා කරන නිලධාරීන් පිරිසක් අදාළ තනතුරු සඳහා අනුයුක්ත කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3032/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 'ඇගාවා' නැමති ඖෂධීය ශාකයට ආදේශක ශාකයක් ලෙස භාවිතා කරනු ලබන, ශ්‍රී ලංකාවට ආවේනික, ඖෂධීය ගුණයෙන් යුතු, ලොව වඳවීගෙන යන ශාක ගණයට අයත් 'වල්ලාපට්ටා' (Gyrinops walla) ශාකයේ දැව ඉන්දියාවට අපනයනය කරන ජාවාරමක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) අපනයනයට සූදානම් කර තිබියදී කලවාන වෙම්මියගොඩ (සිංහරාජ වනාන්තරයට යාබද) ප්‍රදේශයෙන් අත්අඩංගුවටගත් 'වල්ලාපට්ටා' ලී කැබලි කිලෝ ගණන කොපමණද;

(ii) එම දැව කිලෝග්‍රෑම් එකකට ජාවාරම්කරුවන් විසින් ගෙවා ඇති මුදල කොපමණද;

(iii) ලෝක වෙළඳපොලේ 'වල්ලාපට්ටා' දැව කිලෝග්‍රෑම් එකක් අලෙවි කර ඇති මුදල කොපමණද;

(iv) 'වල්ලාපට්ටා' දැව ජාවාරම පසුපස සිටින ජාවාරම්කරුවන් කවුරුන්ද;

(v) එම ජාවාරම්කරුවන් මේ වනවිට අත්අඩංගුවට ගෙන තිබේද;

(vi) ඔවුන්ට ලබාදෙන දඬුවම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 'වල්ලාපට්ටා' නැමති ඖෂධීය ශාකය සංරක්ෂණයට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3093/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යුද්ධය හේතුවෙන් අවතැන්ව සිට නැවත පදිංචිකර ඇති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චුවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, තෙන්නමරවාඩි දෙමළ ගම්මානයේ පවුල් 70 කට පමණ අයත් දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා පාසලක් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානයේ දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා මූලික පහසුකම් සලස්වා දීම අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම බව පිළිගන්නේද;

(ii) එසේ නම්, තෙන්නමරවාඩි ගම්මානයේ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට හැකිවනසේ පාසලක් ඇරඹීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3094/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1996-2006 කාළ පරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන

මණ්ඩලයේ සිදුවූ වංචාවක් වැළැක්වීමට කටයුතු නොකිරීමෙන් විගණන පරීක්ෂක ජයවර්ධන නැමැත්තා විසින් වංචනික ක්‍රියාවක් සිදුකර තිබේද යන්න පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසට පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ වංචා විමර්ශණ ඒකකයට දන්වා තිබේද;

(ii) ඉහත සඳහන් විගණන පරීක්ෂකවරයා අල්ලස් ලබා ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත දන්වා තිබේද;

(iii) එම නිලධාරියාට රැකියාවක් සඳහා විදේශගතවීමට වැටුප් රහිත නිවාඩු අනුමත කර දී තිබේද;

(iv) විධිමත් කමිටුවක් මගින් පැවැත්වූ මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකොට, ඉහත පරිදි ඔහුට නිවාඩු අනුමත කිරීම නීති විරෝධී බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 නොවැම්බර් මස 30 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2109/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද;

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2960/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ජූලි මස 22 වැනිදා සිට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය සඳහා නිලධාරියෙකු පත් කර නොමැති බවත්;

(ii) මේ වන විට එම ධූරයේ රාජකාරී ආවරණය කරනු ලබන්නේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බවත්,

(iii) ඔහුගේ පාලන කාලය තුළ ආඥාපනත් උල්ලංඝනය වන ආකාරයේ කටයුතු රාශියක් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂයකට අධික කාලයක් තිස්සේ හිස්ව ඇති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය සඳහා සුදුසු නිලධාරියෙකු පත් නොකිරීමට හේතු කවරේද;

(ii) අදාළ ආඥාපනත් උල්ලංඝනය වන ලෙස කටයුතු කළ අමාත්‍යාංශ ලේකම්වරයාට එරෙහිව මෙතෙක් ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(iii) සුදුසු නිලධාරියෙකු වනජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ධුරයට පත්කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3033/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට දිවයින පුරා ශ්‍රී ලංගම ඩිපෝවල ගර්හිත බස්රථ වශයෙන් ගාල්කර ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස්රථ වලින් විකුණා ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම බස්රථ විකිණීමෙන් ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී විකිණීමට නියමිත ශ්‍රී ලංගම බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස්රථ විකිණීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බාල ඩීසල් භාවිතය හේතුවෙන් 2011 ජුලි මාසයේ සිට මේ දක්වා ශ්‍රී ලංගමට අහිමි වූ ආදායම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3098/'12

ගරු පී. හැරිසන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ රොන්මඩ ඉවත් කිරීම සඳහා තෝරාගෙන ඇති මුළු වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් එම වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් වැව සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග හා ගොවිජන සේවා නිලධාරීන්ගේ සහාය ලබා ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා වෙනත් අයගේ සහාය ලබා ගන්නේද;

(iii) එසේ නම්, එම අය කවුරුන්ද;

(iv) ඔවුන් අයත් ආයතන කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් වැවෙන් රොන්මඩ ඉවත් කර ඇති අක්කර ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) රොන්මඩ ඉවත්කළ පසු එම වැව්වල කන්න දෙක වගා කිරීමට ප්‍රමාණවත්

ජලය රැස්කරගත හැකිවේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වැව්වල රොන්මඩ වාර්ෂිකව ඉවත් කරන්නේද;

(ii) නොඑසේ නම්, එය සිදු කරන කාල පරාසය කුමක්ද;

(iii) මෙවර රොන්මඩ ඉවත් කිරීමට නොහැකිවූ වැව්වල එම කටයුතු ඉදිරි යල කන්නයේදී සිදුකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 03 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2961/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල යටතේ රුපියල් ලක්ෂ දහහතක් වැයකොට ඉදිකිරීමට වර්ෂ 2003 දී මුල්ගල තැබූ යටදොල ජල ව්‍යාපෘතියේ අඩක් මේ වන විට නිම කර ඇති බවත්;

(ii) එම තත්ත්වය යටතේ යටදොල කනිෂ්ඨ විද්‍යාලයේ සිසු දරුවන්ගේ පානීය ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ ලෙස සපුරාගත නොහැකිව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යටදොල ජල ව්‍යාපෘතිය අඩක් නිම කිරීමට හේතු කවරේද;

(ii) යටදොල ගම්වාසීන්ගේ සහ යටදොල කනිෂ්ඨ විද්‍යාලයේ දරුවන්ගේ පානීය ජල අවශ්‍යතාව පූර්ණ වශයෙන් සලසාදීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3034/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ශ්‍රී ලංගම සතු මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතරින් ධාවනයට සුදුසු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ධාවනයට නුසුදුසු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ පහළොවකට වැඩි කලක් ධාවනයේ යොදවා ඇති ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ දහයකට අඩු කාලයක් ධාවනයේ යොදවා ඇති ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වයර් සහ බැටරි නොමැතිකම සහ වෙනත් විවිධ හේතූන් මත ශ්‍රී ලංගම බස් රථ ධාවනයෙන් ඉවත් කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3100/’12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) රජයේ පාසල්;

(ii) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වසා ඇති පාසල්;

(iii) සේවය කරන ගුරුවරුන්;

(iv) පවතින සම්පූර්ණ ගුරු පුරප්පාඩු;

(v) එක් එක් විෂයය අනුව පවතින ගුරු පුරප්පාඩු;

(vi) වැඩබලන විදුහල්පතිවරු;

(vii) ශ්‍රේණිධාරී ගුරුවරු;

(viii) ස්වේච්ඡා ගුරුවරු;

සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරුමැද පළාතේ, පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කවල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන්නේද;

(ii) එසේ නම්, එම වැටුප කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්වල රජයේ පාසල්වල ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවය කරන්නේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ හෝ වෙනත් ආයතනයක් යටතේ ගුරු පුහුණුවක් ලබා දී තිබේද;

(vi) ඔවුන් ඉදිරියේදී ගුරු සේවයට අනුයුක්ත කිරීමට අපේක්ෂිතද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3135/’12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නාලන්ද කර්මාන්ත පුරය තුළ දැනට,

(i) නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිවෙමින් පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ඉදිකිරීමට යෝජිත කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තපුරය සඳහා වෙන් කර ඇති සමස්ත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම කර්මාන්තපුරය තුළ එක් කර්මාන්තශාලාවකට ලබාදෙන උපරිම හා අවම භූමි ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (අ) හි සඳහන් එක් එක් කර්මාන්තශාලාව වෙනුවෙන් වෙන් කර දී ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉඩම් ලබාදීමේ පදනම කොපමණද;

(v) මේ වන විට ව්‍යාපෘතීන් සඳහා වෙන්කර දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය සහ ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) එම කර්මාන්තපුරය තුළ කර්මාන්ත අරඹා ඇති කර්මාන්තශාලා හිමියන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නාලන්ද කර්මාන්තපුරයට අයත් භූමියෙන් පෞද්ගලික පරිහරණය සඳහා ඉඩම් කොටස් ලබා දීමට හැකියාවක් තිබේද;

(ii) එසේනම්, එය සිදුකරනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2962/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමෘද්ධි සහනාධාර ලබන වයස අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට රුපියල් 1,000ක මාසික දීමනාවක් ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර ඇති බැවින් ඔවුන්ට හිමිවූ සමෘද්ධි සහනාධාර අහෝසි කිරීමට සූදානමක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට සමෘද්ධි සහනාධාර ලබා දීම සඳහා මාසිකව රජය විසින් වැය කරනු ලැබූ මුළු මුදල කොපමණද;

(ii) ඉහත සඳහන් රු.1000ක දීමනාව ලබාදීම හේතුවෙන් දැනට ලබාදෙන සමෘද්ධි සහනාධාර කපා දැමීමට අනුමතිය ලබා දී තිබේද;

(iii) රුපියල් 1000ක දීමනාව ලබාදීම හේතුවෙන් දැනට ලැබෙන සමෘද්ධි සහනාධාර කපා දැමීම වෙනුවට එම දීමනාව සමග සමෘද්ධි සහනාධාරය ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3035/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දුම්රියපළ,

(i) ඉදිකළ දිනය කවරේද;

(ii) ඉදිකළ දින සිට මේ දක්වා ප්‍රතිසංස්කරණය කර ඇති වාර ගණන කොපමණද;

(iii) අවසන්වරට ප්‍රතිසංස්කරණය කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ගම්පහ දුම්රියපළේ,

(i) මහනුවර දෙසට සහ කොළඹ දෙසට ගමන් ගන්නා දෛනික මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දළ දෛනික ආදායම කොපමණද;

(iii) මාසික ආදායම කොපමණද;

(iv) මාසික වාර ප්‍රවේශපත්‍ර ආදායම කොපමණද;

(v) පාර්සල් ආදායම මාසිකව දළ වශයෙන් කොපමණද;

(vii) තිබෙන ප්‍රවේශපත්‍ර කවුළු ගණන කොපමණද;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගම්පහ ඉදිකර ඇති දුම්රිය නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3102/'12

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි ප්‍රදේශවල නියඟයෙන් වගා හානියට පත්වූ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වගා ඉඩම් හිමියන් අතරින් වන්දි ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ලෙස ඔවුන්ට ලබාදුන් මුලු මුදල කොපමණද;

(iv) හානි වූ කුඹුරු ඉඩම් වෙනුවෙන් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් බිත්තර වී ලබා දුන් කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ලබා දුන් බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(v) වගා හානි වෙනුවෙන් ට්‍රැක්ටර් කුලී සහනය ලෙස අක්කරයක් වෙනුවෙන් ලබාදුන් මුදල කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුලු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි එච් කලාපයේ ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවි සංවිධාන අතුරින් මේ වන විට රුපියල් ලක්ෂය බැගින් ලබා දී ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ මුදල් නොලැබූ ගොවි සංවිධානවලට ඉදිරියේදී එම මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහවැලි ප්‍රදේශවල ළිං පිළිසකර කිරීම සඳහා 2012 වර්ෂය තුළදී දුන් මුලු මුදල

කොපමණද;

(ii) එක් ළිඳක් වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3139/'12

ගරු අබ්දුල් හලීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හාරිස්පත්තුව සංවර්ධන පදනම නමැති ආයතනය මගින් 1994 වර්ෂයේදී හල්ලොලුව, වරාතැන්න මහවැලි ගඟ මැද පිහිටි ඓතිහාසික ස්ථානයක ඉදිකර, සංඝ රත්නයට පූජාකළ උදකුක්ඛේප සීමාමාලකය උඩරට අමරපුර සංඝ නිකායේ උපසම්පදා විනය කර්ම සිදු කරන ස්ථානය බවත්;

(ii) මේ වන විට එකී පූජනීය ස්ථානය ඉවත් කර එම ස්ථානයේ පෞද්ගලික විදුලි බලාගාරයක් ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුවන බවත්;

(iii) ඓතිහාසික වැදගත්කමක් ඇති එම පූජනීය ස්ථානය විනාශ කිරීම සම්බන්ධයෙන් දැඩි කළකිරීමට පත්ව ඇති අමරපුර නිකායට අදාළ දිවයින පුරා සිටින ගිහි, පැවිදි බොහෝ පිරිසක් ඊට එරෙහිව විරෝධතාවයකට සූදානම් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උඩරට අමරපුර නිකායේ පරිහානියට තුඩු දෙන එම පෞද්ගලික විදුලි බලාගාරය ඉදි කිරීමේ කටයුතු වහාම නතර කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඓතිහාසික හා පාරම්පරික වටිනාකමක් ඇති උදකුක්ඛේප සීමාමාලකය තුළ ඉදිරියටත් බාධාවකින් තොරව එකී නිකායේ විනය කර්ම සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1521/'11

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වෘත්තීය ගුවන් නියමුවන් පුහුණු කිරීමේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුහුණු කිරීමේ ආයතනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළදී ගුවන් නියමු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වැයවන සාමාන්‍ය වියදම කොපමණද;

(iv) ශ්‍රී ලංකාව සඳහා අවශ්‍ය ගුවන් නියමුවන් සංඛ්‍යාව කොපමණද;

(v) පුහුණුව ලැබූ නමුත් ශ්‍රී ලංකාව තුළ ගුවන් නියමුවකු ලෙස සේවය කිරීමට අවස්ථාව නොලැබෙන ඉතිරි ශිෂ්‍යයන් සම්බන්ධයෙන් ඇති වන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2963/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි, රසායනාගාර නිලධාරී, ඖෂධවේදී, පවුල් සෞඛ්‍ය උපදේශක යන තනතුරු සඳහා නිලධාරී හිඟයක් පවතින බවත්;

(ii) එම නිසා කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් සහ කළුතර සෞඛ්‍ය විද්‍යායතනයෙන් පාලනය වන රෝහල්වල සායන, ගර්භණී හා මාතෘ සායන, ඩෙංගු මර්දන ව්‍යාපෘති ආදී සේවාවන් අඩාළ වී ඇති බවත්;

(iii) ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කළද මෙතෙක් විසඳුමක් ලබා දී නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ මේ වන විට ඉහත සඳහන් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරුවල පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කය තුළ ඉහත නිලයන්හි මේ වන විට සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3036/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාන්ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර ලබා දුන් රට කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා එම රටෙන් ලැබුණු ආධාර මුදල කොපමණද;

(iii) ඒ වෙනුවෙන් වැයකරනු ලබන මුදල කොපමණද;

(iv) ආරම්භකළ දිනය සහ එහි ඉදිකිරීම් අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(v) මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව සහ වාරි ජල පහසුකම් ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3103/'12

ගරු පී. හැරිසන් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ ඇති,

(i) ජනතාව පදිංචි ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ඉඩම් අතරින් සින්නක්කර ඉඩම් කට්ටි, බදු ඉඩම් කට්ටි හා අනවසර ඉඩම් කට්ටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බදු ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමක් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඔවුන්ගේ පදිංචිය එම ස්ථානවලම නීත්‍යානුකූල කරන්නේද;

(iii) එම අනවසර පදිංචිකරුවන්ගෙන් වරිපනම් හෝ වෙනත් බදු මුදලක් අය කරන්නේද;

(iv) විදුලිය හා වෙනත් පහසුකම් ලබාදීමේදී ඔවුන්ගේ අයිතිය සනාථ කිරීම සඳහා පරීක්ෂා කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2036/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විදේශගතවීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය විසින් වාර්ෂිකව වියදම් කර ඇති මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී, නිලධාරීන් විදේශගත වූ එක් එක් අවස්ථාවේදී වියදම් කළ මුදල;

(iii) එම එක් එක් අවස්ථාවේදී නිලධාරීන් විදේශගත වී සිටි දින ගණන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලධාරීන්ගේ ඉහත සඳහන් විදේශගතවීම් හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ යහපත් හෝ අයහපත් ප්‍රතිඵල කවරේද;

(ii) විදේශගත වූ නිලධාරීන්ගේ ගමන් වියදම්, නවාතැන් ගත් ස්ථාන සඳහා කළ වියදම් සහ අනෙකුත් වියදම් එක් එක් නිලධාරියාට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිලධාරීන්ගේ සංචාර විස්තර සටහන් පත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී නිලධාරීන්ගේ මාසික වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2211/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ‘‘මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා’’ ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, දියවර, දියවර විසිරි, ජන උදාන, ගම් උදාන ආදී විවිධ නම්වලින් ඉදි කර ඇති නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොලියද කපාහැර එම නිවෙස්වල

සින්නක්කර අයිතිය ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත එක් එක් නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාසවල සින්නක්කර අයිතිය හිමි වූ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2964/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිකවැරටිය අධ්‍යාපන කලාපය තුළ පිහිටා තිබෙන පාසැල් 57කට මෙතෙක් ස්ථිර විදුහල්පතිවරුන් පත් කර නොමැති බවත්;

(ii) දැනට එම පාසල්වල විදුහල්පති තනතුරෙහි වැඩ ආවරණය කරනු ලබන්නේ වැඩබලන විදුහල්පතිවරුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිකවැරටිය අධ්‍යාපන කලාපය තුළ පිහිටා තිබෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වලට අවශ්‍ය විදුහල්පතිවරුන් සේවයේ නියුක්ත කිරීමට තවමත් පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) එම පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු ඉතා ඉක්මනින් පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ ඇයි?

3037/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුන්දල ජාතික වනෝද්‍යානය සතු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි වසන කුරුලු වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම වනෝද්‍යානය ජෛවගෝල සංචිතයක් ලෙස නම් කර තිබේද;

(iv) එම වනෝද්‍යානය තුළ අක්කර 15ක පමණ භූමි ප්‍රදේශයක දැල්ගසා කුරුල්ලන් කුඩු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තීරණය කර තිබේද;

(v) මෙම වනෝද්‍යානය යොදාගෙන ඉහත පරිදි ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබන්නේ නම් එම දිනය කවරේද;

(vi) එකී වනෝද්‍යානය ඇතුළත අක්කර 15ක භූමි භාගයක දැල් ගැසීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මින්නේරිය ජාතික වනෝද්‍යානයේ, නැගෙනහිර මායිමේ, හෙක්ටයාර 2.2ක (අක්කර 4 - 5ක්) පමණ වනාන්තර ඉඩමේ ජීව්ස් හයිඩ් අවුට් (Jeew's Hide Out) නමින් සංචාරක හෝටලයක් ඉදිකර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම හෝටලයේ ඉදි කරන ලද දිනය කවරේද;

(ii) එම හෝටලයේ අයිතිකරුගේ නම කවරේද;

(iii) එය ඉදිකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලිඛිත අවසරය ලබාදී තිබේද;

(iv) එම ඉදිකිරීමේ අවසරය ලබා දුන් දිනය කවරේද;

(v) ඉදිකිරීමට අවසරය ලබා දුන් ලිපිය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1523/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඉදිරියේදී සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව මුලින්ම මෙහෙයුම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ආරම්භක අවස්ථාවේදී එහි ධාරිතාව සහ දැන් එහි ධාරිතාව වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වෙනත් තෙල් පිරිපහදු කිසිවක් මෙරට කොතැනක හෝ ඉදිවෙමින් පවතින්නේද;

(ii) එසේ නම්, එකී නව පිරිපහදුවල නම් කවරේද;

(iii) ඒවා අතරින් කිසියම් පිරිපහදුවක් රජය විසින් මුදල් යොදවා ඉදිකරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1652/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව සේවයේ නිරතවන පාසල් අනධ්‍යයන සේවකයින්ගේ සේවය මෙතෙක් ස්ථිර කර නොමැති බවත්;

(ii) වර්ෂ 2005 සහ 2008 වර්ෂවලදී බඳවා ගෙන ඇති මෙම පිරිස මේ දක්වා සුළු දෛනික වැටුපකට සේවය කරනු ලබන බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අනධ්‍යයන සේවක පිරිස ස්ථිර කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් ඔවුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(ii) එම හේතු මගහරවා ඔවුන් ස්ථිර සේවක පිරිසට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2966/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ සියලු දෙපාර්තමේන්තු හා ආයතනවල සේවකයින්ට ආපදා ණය ගෙවීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 60ක පමණ මුදලක් වෙන් කළ යුතු වුවද, මේ වන විටත් ඒ සඳහා වෙන් කර ඇත්තේ රුපියල් මිලියන 5ක මුදලක් පමණක් වන බවත්;

(ii) එම නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුම නිලධාරීන්ට තමන්ට හිමි ආපදා ණය ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ දිගු කලක් රැඳී සිටීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට ආපදා ණය ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ රැඳී සිටින සෞඛ්‍ය සේවකයින් අයත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපදා ණය ගෙවීම සඳහා වෙන් කළ යුතු හිඟ මුදල කොපමණද;

(iii) ඉල්ලුම්කර ඇති ආපදා ණය කඩිනමින් ලබාදීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3038/’12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 සුනාමි ව්‍යසනයෙන් පසුව ප්‍රතිසංස්කරණය කරන ලද මොරටුව - මෝදර ධීවර වරායට ඇතුළුවීමට ගොස් මාරියාවට අසුවී, බෝට්ටු පෙරළීම නිසා ධීවරයින් මියගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මොරටුව - මෝදර ධීවර වරායේ ඉදිකිරීම්වලින් පසුව මේ දක්වා ඉහත සඳහන් පරිදි මියගොස් ඇති ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය එම ධීවරයින් සඳහා වන්දි මුදල් ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, මේ වන විට ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) මිය ගිය එක් ධීවරයෙකු වෙනුවෙන් එම පවුලට ප්‍රදානය කළ වන්දි මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වාරකන් කාලයේදී මොරටුව-මෝදර ධීවර වරායෙන් මුහුදු ගොස් නැවත පැමිණෙන ධීවර බෝට්ටු එම ධීවර වරාය තුළට පිවිසිය නොහැකි තත්ත්වයක් ඇතිවීමට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 දෙසැම්බර් මස 08 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2065/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර මහකනදරා වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම පිළිගත් ටෙන්ඩර් පටිපාටියට අනුව ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබා දුන් ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(iv) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහකනදරා වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී අක්‍රමිකතා සිදු වූ බවට ජනාධිපති විමර්ශන අංශය මඟින් හෙළිදරව් කර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ අනුව ඊට චෝදනා ලැබූ නිලධාරීන් කවුරුන්ද;

(iii) එම අවස්ථාවේ දී ඔවුන් දැරූ තනතුරු කවරේද;

(iv) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, මේ වන විට ඔවුන් සේවය කරන ස්ථාන කවරේද;

(vi) මේ වන විට ඔවුන් දරන තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2212/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ නාගරික මහල් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන්ට එම නිවාසවල සින්නක්කර අයිතිය ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නාගරික මහල් නිවාසවල සින්නක්කර අයිතිය පදිංචිකරුවන්ට ලබා දීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට මහල් නිවාසවල සින්නක්කර අයිතිය හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2967/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රමිතියෙන් තොර ඉන්ධන සැපයීම නිසා වර්ෂ 2010 දී අසාදු ලේඛනගත කළ විමොල් නමැති ඉන්ධන සැපයුම් සමාගම වෙතින් 2012 වර්ෂයේ මුල් මාස 8 තුළ නැවත ඉන්ධන මිලදී ගෙන ඇති බවත්;

(ii) එම සමාගමෙන් ලබාගත් තත්ත්වයෙන් බාල ඩීසල් භාවිතය හේතුවෙන් පෞද්ගලික බස් රථ 1000 ක් ලංගම බස් රථ 50 ක්, දුම්රිය 10 ක් ඇතුළු තවත් වාහන විශාල සංඛ්‍යාවක් අක්‍රීය තත්ත්වයට පත්ව ඇති බවත්;

(iii) එම හේතුවෙන් ශ්‍රීලංගමයට පමණක් දිනකට රුපියල් ලක්ෂ 10 ක පමණ අලාභයක් සිදුවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අසාදු ලේඛනගත කළ ඉහත සඳහන් සමාගමෙන් නැවතත් තෙල් මිලදී ගැනීමට අනුමතිය ලබා දුන් අය කවුරුන්ද;

(ii) එම සමාගමෙන් මිලදී ගෙන ඇති ඩීසල් ප්‍රමාණය කොපමණද;

(iii) යම් සමාගමකින් ඉන්ධන මිලදී ගනු ලබන විට එම ඉන්ධනවල ප්‍රමිතිය පරීක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සමාගමෙන් මිලදී ගත් ප්‍රමිතියෙන් තොර ඩීසල් භාවිතය හේතුවෙන් කාර්මික දෝෂවලට ලක්වූ වාහනවල හිමිකරුවන්ට වන්දි මුදලක් ලබා දීමටත්;

(ii) ප්‍රමිතියෙන් තොර ඩීසල් සැපයූ සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3039/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ගොවිජන සේවා සහ වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාදුරුඔය වනෝද්‍යානය සතු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි ඇති වටිනා ගස් වර්ග කවරේද;

(iii) එම වනෝද්‍යානයේ ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමට ෆයිනස් වගාව වෙනුවට වගාකළ හැකි වෙනත් විකල්ප වගාවන් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාදුරුඔය වනෝද්‍යානය තුළ දැව ජාවාරම සහ සතුන් දඩයම් කිරීම සිදුවන බවත්;

(ii) මෑතකදී එහි සිටි ඇතෙකු මරා, දළ කපාගෙන ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් පරිදි කපාගෙන ගොස් ඇති ඇත් දළයේ වටිනාකම කොපමණද;

(ii) එම සිද්ධිය සම්බන්ධ ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) මාදුරුඔය වනෝද්‍යානය තුළ සිදුවන දැව ජාවාරම සහ සතුන් දඩයම් කිරීම වළකාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 168/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ග්‍රීක බැඳුම්කරවලින් කරන ලද ආයෝජනයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

වගකීමෙන් තොර දේශීය ආර්ථික කළමණාකරණය විසින් වඩාත් අයහපත් තත්ත්වයට පත්කරන ලද, ගෝලීය මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපා කලාපයේ ආර්ථිකයන් කිහිපයක්ම 2010 වර්ෂයේදී පමණ අර්බුදකාරී තත්ත්වයට ඇද වැටුන හෙයින්ද;

ග්‍රීසිය සිය ඇස්තමේන්තුවලට වඩා බෙහෙවින් පහළට වැටුණු වර්ධන වේගයක්ද, විශාල පරතරයකින් බදු ආදායමට වඩා අධික වූ වියදම් සමග ගොඩනැගුනු රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවන්ද, පාලනය කළ නොහැකි ලෙස ඉහළ යමින් ඇති ණය බරද, රජය සිය අයවැය පරතරය පිළිබඳව මවා පෑ අගයන් ලබාදෙමින් යුරෝපා සංගමය නොමග යැවූ බව අනාවරණය වීමෙන් පසුව විශ්වාසය තැබිය හැකි බව සහමුලින්ම පාහේ ගිලිහී ගිය නිල සංඛ්‍යා දත්තද හේතුවෙන් වඩාත් හානියට පත් වූ රටවලින් එකක් බවට පත් වූ හෙයින්ද;

2010 ප්‍රථම කාර්තුව වනවිට ග්‍රීක රජයට සිය ණය ආපසු ගෙවීම සඳහා වූ බැඳීම් සපුරාලීමට ඇති හැකියාව බරපතල ප්‍රශ්නයකට භාජනය වී රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හරිනු ඇතැයි යන බිය ඇති කළ හෙයින්ද;

ශ්‍රේණිගත කිරීමේ ආයතන ග්‍රීක ණයවලට ''නොවටිනා'' යන තරාතිරම ලබා දී, එමගින් ග්‍රීසිය වෙත ලබා දෙන පුද්ගලික ණය සම්පූර්ණයෙන්ම සිඳී තිබූ හෙයින්ද;

2010 අප්‍රේල් මාසයේදී ග්‍රීක රජය ආර්ථික ගොඩගැනීමේ ණයක් සඳහා අයැදුම් කළ අතර, ආර්ථිකය තව තවත් අයහපත්වීම නවතාලීමේ අපේක්ෂාවෙන්, දෘඪතර අරපිරිමැස්මකින් කටයුතු කිරීම සඳහා වූ යෝජනාවලියක්ද කොන්දේසි වශයෙන් පනවමින්, යුරෝපා කලාපයේ රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධව අරමුදල් සපයන ලද, යූරෝ බිලියන 110ක ආධාරයක් අනුමත කරනු ලැබූ හෙයින්ද;

මුදල් අංශයෙන් කිසිදු සුනම්‍යතාවයක් නොමැති වීම හේතුවෙන් ග්‍රීක රජයට එම දැඩි මූල්‍ය පාලන කොන්දේසි අනුව කටයුතු කිරීමට නොහැකි වීම නිසා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයන් ජනතාවට වීදි බැස කැරලි ගැසීමට සැලැස්වූ හෙයින්ද;

ග්‍රීක ආර්ථිකය ඇද වැටීම දිගින් දිගටම සිදු වෙමින්, ග්‍රීක ණය පිළිබඳ විශ්වාසය කැපී පෙනෙන ලෙස අඩු වී, එමගින් රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හරිනු ඇතැයි යන අපේක්ෂාව තවත් ඉහළ නැංවූ හෙයින්ද;

2011 මාර්තු මාසයේදී ''මූඩි'' නමැති ආයතනය විසින් ග්‍රීක ණය ''නොවටිනා'' යන ප්‍රභේදයේ ගැඹුරටම ඇද දමා, එයට ඉහළ අවදානමක් සහිත ශ්‍රේණියක් ලබා දෙමින්, සෘණාත්මක ස්වරූපයක් ලබා දුන් හෙයින්ද;

මෙම ප්‍රවණතාවයත් සමග ආයෝජකයින් සීඝ්‍රයෙන් ග්‍රීක බැඳුම්කර ''වටිනාකමකින් තොර කඩදාසි'' ලෙස බැහැර කිරීම සහ ග්‍රීක රජයට අරපිරිමැස්මෙන් කටයුතු කිරීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා, යුරෝපා කලාපයේ රටවල් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධව ලබාදෙන ආර්ථිකය ගොඩගැනීමේ ආධාර මුදල ඇණ හිටීමෙන් නුදුරේ එන රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ තත්ත්වය නිසා ග්‍රීක බැඳුම්කරවලට ඉදිරිපත් කෙරෙන ප්‍රතිලාභ ඉහළ යාම ඇරඹුණු හෙයින්ද;

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2011 අප්‍රේල් මස මුල් භාගයේදී විශාල අලාභයක් ඇතිවීමේ අවදානම ඇතිව යූරෝ මිලියන 22ක් ග්‍රීක බැඳුම්කරවල ආයෝජනයකර ඇතැයි පැවසෙන හෙයින් ද;

ග්‍රීක බැඳුම්කර සමහරක් පාඩුපිට විකිණීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට විශාල අලාභයක් සිදුව ඇති බවට පුවත්පත් හෙළිදරව් කිරීමෙන් අනතුරුව, 2012 ජූලි 17 වැනි දින මෙය පාර්ලිමේන්තුවේ මතු කළ හෙයින් ද;

එය සත්‍යයක් නම්, ආයෝජනයන්හි විස්තර සහ විශේෂයෙන්ම මූල්‍ය මණ්ඩලයේ කැමැත්තෙන් තොරව එබඳු ආයෝජනයක් සිදුකළේ මන්දැයි අමාත්‍යතුමාගෙන් විමසා සිටි හෙයින් ද;

එම ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, අප්‍රේල් මස මුල් භාගයේදී මහ බැංකුව ඇත්ත වශයෙන්ම ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කර ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ප්‍රකාශ කළ හෙයින් ද;

එම ආයෝජනය සාධාරණීකරණය කරමින් "එම තීරණයට (ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කිරීමට) බලපානු ලැබුයේ එම කාලය වනවිට (2011 අප්‍රේල් 05) යුරෝපයේ පැවති, මූල්‍ය ස්ථාවරත්ව පැකේජයක් මගින් සහය දෙනු ලැබූ අර්බුද කළමනාකරණය සඳහා වූ ශක්තිමත් රාමුවක් පැවතීම නිසා" බව ගරු අමාත්‍යතුමා පැවසූ හෙයින් ද;

"එබැවින් එම අවස්ථාව වනවිට ග්‍රීසිය බේරාගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අධිකාරීන් විසින් නිර්මාණයකර තිබූ මෙම විශාල අරමුදල පැවතියේය. එහෙයින් අවස්ථානුගත කරුණු යටතේ, අවදානම සැලකිය යුතු ලෙස අඩු සහ දරාගත හැකි යැයි සලකන ලදී." යනුවෙන් ගරු අමාත්‍යතුමා තවදුරටත් සඳහන් කළ හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා සිදුකළ උක්ත ප්‍රකාශය අසත්‍ය බව පෙනී ගොස් ඇති හෙයින් ද;

ග්‍රීක බැඳුම්කරවල අවදානම සැලකිය යුතු ඉහළ සහ ගෙවීම් පැහැර හැරීම අත්‍යාසන්න වූ හෙයින් ද;

ග්‍රීක බැඳුම්කරවල ඉහත කී ආයෝජනය සිදුකළ කාල වකවානුව වනවිට එම රට සමග යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම (EFSF) පිළිබඳ සැලැසුමක් නොතිබූ හෙයින් ද;

යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම මගින් ග්‍රීසිය සිය මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා මූල්‍යාධාර ලබාගත්තේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පමණක් දෙවැනි වන්නා වූ "වරණීත ණය හිමියා" තත්ත්වය සහිත නිත්‍ය යුරෝපීය ස්ථාවර යාන්ත්‍රණයක් (ESM) බවට තාවකාලික යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම (EFSF) පරිවර්තනය කරමින් තිබූ බැවින්, එය ශ්‍රී ලංකාවට වාසිදායක නොවන හෙයින් ද;

"වරණීත ණය හිමියා" තත්ත්වය යනුවෙන් අදහස්වන්නේ, වරණීය අනුපිළිවෙළ අනුව ගෙවීම් සිදුකිරීමේදී, යුරෝපීය ස්ථාවරත්ව යාන්ත්‍රණය (ESM)මගින් සිදුකළ ආයෝජනයන්ට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හැර අනෙකුත් සියලු පාර්ශවයන්ට වඩා ප්‍රමුඛතාව ලැබෙනු ඇතැයි යන බව හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකළ ආයෝජන නොගෙවා පැහැර හැරීමේ බරපතළ අනතුරක් පැවති හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව ආයෝජනය කළ අරමුදල් සැබෑ ලෙසම දැඩි අවදානමක පවතිද්දී, ඒවා සුරක්ෂිත බව හඟවමින් ගරු අමාත්‍යතුමා සභාව නොමග යවා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව ග්‍රීක බැඳුම්කරවල සිදුකළ නොසැලකිලිමත් ආයෝජනයෙන් ඉක්බිතිවම, ග්‍රීක රජය යළිත්වරක් අසමත්ව, එහි ණය ශ්‍රේණිගත කිරීම ලොව අඩුම අගය දක්වා පහත හෙළූ හෙයින් ද;

2011 ඔක්තෝබර් වනවිට, එහි ණය සියයට 50කට වැඩි ප්‍රමාණයකින් කපා හැරීමට ණය හිමියන් එකඟ වූ පාලිත ණය පැහැර හැරීමකට ග්‍රීසිය එළැඹි හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ඉතිරිව පැවති ග්‍රීක බැඳුම්කරවල ආයෝජිත මුළු මුදලින් 53.5% (අධික වට්ටමක් සහිතව විකිණීමෙන් පසුවද) රටට විශාල අලාභයක් සිදු කරමින් අහිමි කර ගනු ලැබූ හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා 2012 ජූලි 17 දින කරන ලද ප්‍රකාශයේ සත්‍ය හෙළි නොකරමින් සහ එම ආයෝජනය සාධාරණීකරණය කරමින් "එම අවස්ථාවේ ග්‍රීසිය ආරක්ෂා කිරීමට ගෝලීය මූල්‍ය අධිකාරිය විසින් අරමුදලක් ඇති කළ බව" සහ එනිසා "එම අවදානම මධ්‍යස්ථ වශයෙන් අඩු සහ දරාගත හැකි මට්ටමක පවතින බවට සළකණු ලැබූ බව" හඟවමින්, හිතාමතාම සභාව නොමඟ යවා ඇති හෙයින්ද;

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ග්‍රීක බැඳුම්කරවල කරන ලද යූරෝ මිලියන 22ක ආයෝජන සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා සභාව නොමඟ යැව්වේද සහ සභාව නොමඟ යවා ඇත්තේ කොපමණ ප්‍රමාණයකට ද යන්න තීරණය කිරීමට; සහ

(ආ) එම අවස්ථාවන්හිදී ගත හැකි පියවර පිළිබඳව සභාවට නිර්දේශ කිරීමටත්,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකවරයා විසින් නම් කළ යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලියවිලි සහ වාර්තා කැඳවීමටත්, යම් තැනැත්තෙකුට පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසත්, එම තැනැත්තන් සතුව හෝ ඔවුන්ගේ පාලනය යටතේ තිබෙන ලියවිලි, පොත්, සටහන් හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙසට විධාන කිරීමටත් බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා හෝ ඒ සඳහා විශේෂයෙන් බලය පැවරූ නිලධාරියෙක් විසින් සිදුකරවන දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥා දීමක් මත සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම සහ සාක්ෂිකරුවන්ගේ වාචික පරීක්ෂණ මගින් තහවුරු කරගැනීම හෝ වෙනත් ලෙසකින් නිශ්චය කරගැනීමටද;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමටද;

(ඉ) එමෙන්ම කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යැමටද බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම වාර්තාව කාරක සභාව පළමුවරට රැස්වූ දින සිට වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව ලබාදෙන එවැනි වෙනත් හෝ ඉදිරි කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.